## මව්බිමේ උදානය !

ගෙලවට පලන්දා මිණිමුතු පබළු මනා
නළලත තබා රන්වැලි සෑ තිලක මෙනා
මහවැලි කැළණි ගංගා දිගු වරළ උනා
හැඩවෙන රහ පෙනේ ලංකා දෙව් අහනා

දසතින් පහර වැද දුබලව තිබුණි රට
සොරබිය මර බියෙන් ඇළලුනි හතර වට
උතුරෙන් දකුණ බෙදුමට කැසකවන විට
ලැබුණේ නියම නායකයෙකි ලක් බිමට

ඇසුණද දෙස් දෙවොල් බොරු බේගල් නිතර
තිබුණද නොයෙක් අගහිඟකම් ගෙදර දොර
නෙකවිද අවුල් දුරු කොට මනසින් බැහැර
බහුජන මතය රට වෙනුවෙනි එක පැහැර

දුගී බවෙන් තොර දූෂණ නොමැති රටක්
දියුණුව නමැති මග ඉහළට නගින රටක්
සැනසුම් සුසුම් මැද හිරු දෙව් වඩින රටක්
කාගෙත් පැතුම තම දූ දරුවන්ට හෙටක්

සිව්රඟ සෙන් සෙබළ මුළු නොම වී දීන
සුන්කර දැමූයෙන් පරපෝෂිත රෑණ
තුන් සිත් පුරා එළිකර ගන්නට හීන
එකමුතුකමින් රට රැකගන්නට ඕන

පෙර රජ දවස අටුකොටු තරවී තිබුණ
සහලින් ස්වයංපෝෂිත හෙළ රජ දහන
පරදේශයට අතපෑමට වූ කරුණ
වටහාගත යුතුය යොදවා සිහි නුවණ

මව්බිම පෙරටු කොට අප දිවි තිබෙන තුරා
දුනහොත් සියළු දෙන අත බේදයෙන් තොරා
කෙහෙළිය නගා ලක්මව සිහ අසුන දරා
දිදුලත නිසැකවම පෙරදිග අඹර පුරා

♦ ශ්‍රියා කුමාරසිංහ
Dunedin - New Zealand

## ඔබවත් දුටුවද එළියක් ?



ඔබවත් දුටුවද එළියක්
කළුවර රෑ හඳපානක්
සෙවනැල්ලක ජායාවක්
මඳ අඳුරේ සේයාවක්

විසල් පොළව මත
රූප ඇඳේවී
නැතිදේ ඇති සැටියටම
පෙනේවී
ඒ මායාවෙන් ඔබ
රැවටීලා
විනාශයක මුල පැදීලා

අවිදු අඳුර මත සිතුම් පෙනේවී
නොහොඳ රසක් හැටියටම පෙනේවී
ඒ මායාවෙන් ලොව රැවටීලා
අනාගතේ මග යයි වැසිලා

♦ ආචාර්ය
විකුම්ප්‍රිය පෙරේරා USA

## චිරං ජයතු අප ජනපතිඳාණෙනි !

ඈදී එන්නේ ඈදී එන්නේ
මේ මහා ජන ගඟයි ඔබ වෙත
නැඟී යන්නේ නැඟී යන්නේ
කෙළෙහි ගුණ දත් දනන්ගේ හඬ
දිනක් පාසා දිනක් පාසා
බියෙන් තැති ගෙන දිවි ගෙවද්දී
ඔබයි අප නිති අපයි ඔබ නිති
රැකගත්තෙ අත්වැල් බැඳන්

මහා කරුණා ගුණය පෙරටුව
සත වෙතට මුදු මොළොක් වදනින්
දෙසූ දහමින් පිරුණු හදවත
සැදී පැහැදුනි සෙත සදන්නට

බලා ඉන්නේ දරු පැටවුන් හැම
දෙමාපියන් වෙත දෑස් අයා
ඒ දරුවන්ගේ දුක්ගිනි නිවුණේ
පියාණන්ව ඔබ සිටි හන්දයි

උදාර මිනිසත්කම් සුරකින්නෝ
අපරාජිතමය සදා කාලයේ
ජය ජයවේ මතු දාටත් ජයවේ
චිරං ජයතු! අප ජනපතිඳාණෙනි!

♦ අමර ගුණසේකර
Paris France

## එගොඩ වෙනු බැරි

ගඟ හරහා බැදි පාලම හොඳටම දිරලා
එගොඩ කෙසේ යම්දෝ මේ පොඩි උසුලා
කෙකටිය මල් මඩ වතුරේ මතුව ඇවිත්
කිරළ ගෙඩි වැටෙන හඬට මාළු බයවෙලා
මැණිකේ ඒවිද දිය නාගන්නට හනිකේ
කාන්සියක් හිතට ඒය නොදැනිම වාගේ

♦ දළුපොත ප්‍රභාත්කුමාර

# නිර්මාණ Nirmana

## ජනපතිඳුනි !

බල ඇණි වන්නි රට යාපා පටුන් බැඳ
පණවැනි ලෙසට රට රැකගෙන දිනා යුද
පටහැනි දුදන පරගැති බල කඩා බිඳ
හයවැනි මිහිඳු ජන සම්මත වුණා අද

බැ ඳ රැහිණින් සිහල අන්තිම රජ පොරණේ
තෙද බිඳ පරයන්ට රට පාවා දුන්නේ
ම ද නැණ ඇති නිසයි සිංහල නිවටුන්නේ
අ ද නැත එවැනි උන් ජයපානය බොන්නේ

අ ත ව ර කොට ලක්බිම සාරය බොන්ට
අ ව ස ර නැත පරදෙස්වල සතු රන්ට
දොරහැර දෙන්ට උන් හට රිසි ලෙස එන්ට
ඉ ඩ හැ ර නොදෙනු ජනපතිඳුනි නිව ටුන්ට

ර ට දැය වඩා එක්සත් කොට සියළු දන
ව ට කොට මඩා බල රට කන අය දුදන
හෙට ලොකු කුඩා සැමදෙන හට දී සහන
සි ට වනු විඩා පත් ලක්බිම ජය පහන

♦ වෛද්‍ය උපාලි අබේසිරි
Middx UK

## ලක්මව අමතයි

ලැබුණා නිදහසක් නොරටුන්ගෙන් අපට
තිබුණා යුද්ධයක් කැඩුමට රට දෙකට
ලැබුණා ජයක් බහුතරයක් පැතු ලෙසට
පිරුණා මගේ හදවත පිරුණා සතුට

නිල් කොළ රතුපාට සිත්තුළ දරා ගෙන
පිල් පිල් බෙදී මගෙ දරුවන් මරා ගෙන
ජීවත් වුවොත් මේ අනුවණ විලා සෙන
ඉන්නට වේවි මට කඳුලැලි පුරෝ ගෙන

දෙපිලයි ඉන්නෙ මට දරුවන් මා දන්න
මට හිතවත් සහ කොටසක් වින කරන
රට දැය සමය ගැන අබිමන් ඇති කරන
නවයුගයකට පිය නැගුමට සැර සෙන්න!

♦ කුමාරි විජේරත්න
Hounslow Middx UK



## දියනා මහින්ද

පතුරන ගමේ සුවඳක් හැම කෙස් ගහම
හෙළ උරුමය රකින දන පෙර රජ දහම
සිරි ලක උතුම් රට කළ හැකි මුළු ලොවම
දියනා මහින්දය නායකයා එකම

දිය නම් මිහිතලෙයි අප හැමදෙන ඉන්නා
නා යනු ඉඳුය නායකකම අර ගන්නා
දියනා මහින්දය අද අපහට ඉන්නා
ඔහුමය උරුමකරු මුළු ලොව ජය ගන්නා

දෙදහස් පන්සියක් බුදු වස ගෙවුණු තැන
දියනා රජකු එන බව ලොව බබුලු වන
පැරකුම්බා සිරිතෙ කියවෙන කරුණ ගැන
දක්වති සැලකිල්ල උගතුන් බොහොම දෙන

පැරකුම්බා සිරිතෙ තව දුර පැවසෙන් නේ
හයවෙනි පැරකුම්ය දියනා ලෙස එන් නේ
මහි ඉඳු මහින්දය අද ඒ තැන ඉන් නේ
ඒ දියනා මගිනි සිරි ලක බබලන් නේ

දියනා මහින්දගෙ මහිමෙන් සිරි ලකට
උතුරා යස ඉසුරු විස්මිත වෙන ලෙසට
පාරාදීසයක් වී යළි මුළු ලොවට
සිරිලක නැගෙනු ඇත ලෝකෙම මුල් තැනට

♦ මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම
Harrow UK

## රට එක සේසත් කළ රජු

නොබෙදුණු නොකැඩුණු එකම රටක් ලෙස
තබනට මුලු රට එක ධජයක් යට
වනසා රුපු රැළ පතුරා සිහ නද
ලක පමණක් නොව ලොව ද දිනූ ඔබ
කිරුළ හිසේ නැති වුව නයුවාණෙනි!
ඔබය අපේ - රජ පතමු දිගා යුෂ!
නිති අප හද පත්ලෙන් නැගෙනා.....

♦ කාන්ති විරක්කොඩි London EC 4

## ඉතින් ආයුබෝවන් !

එංගලන්තයෙදි සිංහළ කිය වන්න
මසකට වරක් නොවැරදි නිවසට පැන්න
ලංකාවිත්ති ඔබ අමතා පව සන්න
කරුණක් තිබේ මව්රට යමි නව තින්න

ගණනක් වසර ලන්ඩන්වල ඉගෙන ගෙන
ලැබගත් දැනුම ඇත මා තුළ රැගෙන යන
සිරි ලංකාව වෙත යමි හද බැඳුණ තැන
අද නිවහල් රටකි උපතින් උරුම වුණ

හිතවත් පිරිස ඇත ලන්ඩන් හතර වට
ගතකළ යුගය සැපතකි මිහිරිය හිතට
අත හිත දෙමින් සෙනෙහස පෑ සැම දෙනට
පුද දෙමි මගේ හොඳහිත සහ කඳුළු කැට

අමතක නොවෙයි හිතවත්කම මට දුන්න
පා ඔසවන්නෙ කොහොමද මන්දා යන්න
ආසිරි තිළින සැලකිලි නොඅඩුව දුන්න
හැමටම මගේ ස්තුති මල් මිට මෙන්න!

♦ ලක්දාස් රවීන්ද්‍ර රූපසිංහ
Letchworh, Herts, UK

## අම්ල මුතු....!

දෙතොලතර පොපියන
සොඳුරුතම සිනහ පොද
රැගෙන ගියෙ කවුරුන්ද
ඈතකට.....

බලාපොරොත්තුව් දැල්වුණ
පහන් සිළුවක උණුසුම
නිවාදැම්මේ කවුරුන්ද
අකාරුණිකව.....
සීතලෙන් ගැඹුරටම ගල්ගැහුණු
සිතකට පුංචිම පුංචි
උණුසුමක්වත් දෙන්නට
කදෝ පැණියෙකු
තරමින්වත්
එළියක් දෙන්නේ කවුරුන්ද
ඉතින් මින් මතුවට.....

දෑසින් වැටෙනා කඳුළු කැටවලට
මිළ කළ නොහැකි බරක් දැනේවි
ඒවා මුතු වේවි.

වසන්තාකුමාරි දසනායක
කිරිඳිවැල Sri Lanka



## කහ අරලියා මල

ප්‍රභාතයේ සුපිපි
සොඳුරුතම දසුන
විකසිතව සුවඳ දුන්
කහ අරලියා මල
අතු අග

නෙලාගන්න විගසින්
නෑ බලා ඉන්න
ඈත සිට මලේ ලස්සන
අරුම
උඩු සිතත් යටි සිතත්
ද්වන්ධ සටනක
යෙදී සිටි මොහොතක

නෙලාගෙන නොව කඩාගෙන
ගිය පසු ඒ මල කිසිවෙක්
නටුව පමණක් ඉතිරි කර
වැලපුණා ඉකිබිඳ
උඩු සිතත් යටි සිතත්
සමගිව එකට අත්වැල් බැඳ

♦ සුරන් අබේවර්ධන
රුහුණු සරසවිය
Sri Lanka

## ආදරේ අතර මග

අතරමග නැවතී ආදරේ
මා සොයා ඇවිදින්
යන්න පිය මැන ආයේ
දෑත ගෙන මා හා

දිවි මගේ මල් වසන්තයේ
සැඟවිලා හද දසන්තයේ
බලා සිටියේ ඔබ නොවෙදෝ
නෙත් පහන් දල්වා

සත් යොදුන් මගමින් එදා
අමතකද කළ කී කතා
දුරස් වූයේ ඔබම නොවෙදෝ
ජීවයේ මල් තලා

මාලපල්ලේ
♦ කුමුදු රොහාන්
අමරසිංහ
Edmonto - London



## පායාපන් යළිත් !

දකින්නටමැ
රිසිවීය හසරැල්
විඳින්ටමැ
නොතිත් වීයැ
මනලොල්
පායාපන් සිත් අහසේමැ
යළිත්
විළිකුන් සුරත් එල වැනි
රිවිමඬල විලසින්!

♦ ධම්මි විජේසිංහ
Toronto - Canada

## චිරං ජයතු !

දුටුගැමුණු පරපුරෙන් පැවත එන මැතිඳුනේ
ලක්මවගෙ කඳුළු බිඳු පිස දැමූ නිරිඳුණේ
සාමයේ පරෙවියන් සිව්දෙසට ඉගිලුණේ
ලැබු ජයෙන් මුළු රටම ප්‍රීතියෙන් ඉපිලුනේ

විසාලා නුවර ලෙස තුන්බියෙන් සැලුණු රට
විජය ධජ බන්දවා ජනතාව උදම් කොට
කැවුම් කිරිබත් සදා උන් බුදිනු දකින විට
කේතුමතියේ වැනුම් නැඟී එයි මතක යට

අපහාස උපහාස මෙත් සිතින් ජය ගත්ත
ලොව වටා බලවතුන් අභිමනින් මැඩ ගත්ත
ඉන්දියන් සාගරේ මුතු ඇටේ රැක ගත්ත
දැයට කිරුළත් ඔබයි ජනයාගෙ හිත ගත්ත

හෙළ වීර සිහලකම් මෙයයි පහදා දුන්න
කියන දේ කරන ඔබ කරන දේ කිය මින්න
දැයක් ඔසවා තැබූ පින් මහිම ලැබ ගන්න
සුබ අනාගතයටත් යන පාර පෙන් වන්න

ඒ මහඟු අරමුණුත් ඉටුකරන බව දනිමු
මහා පවුරක් විලස ඔබ වටා අපි සිටිමු
පළමු දෙවනුව තෙවනු දිනූ රට රැක ගනිමු
චිරත් කල් දිනේවා! රජිඳුණේ සෙත් පතමු

♦ පද්මා කුරුප්පු
Paris - France

## ජනපතිතුමනි !

ගසන ගසන මඩ ආපසු වැදේවා
දුදන කුරිරු සිතුවිලි වල් වැදේවා
අලගිය වන්න මුකවෙටි යළි ඉපදේවා
කස්තුරි ඔවුන් දිව මුලටම තැබේවා!

අහසේ උසට බඩු නැග්ගත් කමක් නැහැ
කොපමණ ඉඩකඩම් ගත්තත් කමක් නැහැ
ඒ මුළු රටම ඔබ ගත්තත් කමක් නැහැ
චන්දය දෙන්න මට එන්නට පිනක් නැහැ

♦ එස්. කංකානම්ගේ
London SE

## අළුත් ඉරක් පායා !

දෙදහස් දහය නව වසරක් උදා කර
නව හිරු රැස් කැරළි පතුරා විදා හැර
සාමය සතුට සැප සම්පත් ළඟා කර
මගෙ ලක්බිමට පායා ඇත අළුත් ඉර

තිස් වසරක් වින්ද දුක් සහමුලින් සිඳ
සතුරන් පරදවා විරුවන් සටන් වැද
ලැබගත් ලක්මවුන් සැනසුම් සුසුම් පොද
රැකගත යුතුය සමගිය හදවතින් බැඳ

මුළු රට මගුල් ගෙදරක කිංකිණී සද්දේ
කිරිබත් කැවුම් කැවා සොම්නස මැද්දේ
මහජනතාව නුවණැස යොදවා චන්දේ
යුතුකම ඉටු කළා රැක බල ඇති කොන්දේ

මිහිඳු සමිඳු ලක්බිම වෙත වැඩිය ලෙද
ජනපති තුමනි! බාරයි රට ඔබට අද
එක මවකගේ දරුවන් ලෙස සිටින හොඳ
සදහම් දීපයක් කළ මැන තිබෙන තෙද

♦ ප්‍රේමා එස්. රූපසිංහ
නුගේගොඩ Sri Lanka

## වසන්තය ආවා ගියා

ඉරට හොරෙන් හදට හොරෙන්
ඇවිදින් නුඹ මගේ ළඟට
මටත් නොකිය හොරෙන් ගිහින්
පැල දොරින් දුර ඈතට
රෝස ලපලු නැලවි නැලවි
හිනැහෙනවා අරුණැල්ලට
ලා හිරු කැන් නැති බව මට
කියයි සුළඟ වැදී ගතට

පිනි බිංදුත් දිලිසි දිලිසි
සරසනවා නීල පලස
මට අහිමි වූ වසන්තයේ
හත් පාටත් උදුර ගෙනම
බටිති මලිති සූටික්කියො
ගී ගයන්නෙ උජාරුවට
උන්ගෙ විහග ගීත වලට
දුක දැනෙනා බව දැන දැන

සුවඳ මලට හාදු දෙන්න
සමනළයින් ළං වෙනකොට
සුවඳ මගෙන් හංඟනවා
නේක කැකුළු නක්කලේට
මී මැස්සන් පැනි මවනවා
දෙබරෙ ඈතුළෙ වෙවී දබර
සරදම් දෙයි ගුමු ගාමින්
අහිමි මගේ වසන්තයට

♦ එරංගා පෙරේරා
Netherlands